017

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන
පස්වන මට්ටම/හයවන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
**STU5415/STU6306** - අධ්‍යාපන කළමනාකරණය
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.11.26 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>1 වන කොටස</u>

01. "කාර්යක්ෂමතාව" හා "ඵලදායීතාව" යන්න පැහැදිලි කරන්න.

02. කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධාන මූලිකාංග හතර (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. "ඵලදායී පාසල" යන්න නිර්වචනය කරන්න.

04. "විමධ්‍යගතකරණය" යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? පැහැදිලි කරන්න.

05. ඵලදායී පාසලක් හඳුනාගත හැකි නිර්ණායක පහක් (05) සඳහන් කරන්න.

06. මැක්ස් වෙබර් (Max Webber) විසින් හඳුන්වා දුන් නිලබලවාදී ආකෘතියේ ලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න.

07. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයෙහි පවතින ගැටලු පහක් (05) සඳහන් කරන්න.

08. අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ දැනුම, පාසල් කළමනාකරුවෙකුට වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 x 08 = 40)

## <u>2 වන කොටස</u>

09. i. "අධ්‍යාපන කළමනාකරණය" යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. "අධ්‍යාපන කළමනාකරණය" හා "අධ්‍යාපන පරිපාලනය" අතර වෙනස උදාහරණ දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණයේ සංවිධාන ව්‍යුහය ඇඳ, ඔබ විසින් දක්වන ලද ව්‍යුහයේ තලයන් හතරකට (04) අදාළ ප්‍රධාන කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. i. බ්ලේක් හා මවුටන්ගේ කළමනාකරණ ග්‍රිතය නිවැරදිව ඇඳ දක්වන්න. (ලකුණු 04)

ii. බ්ලේක් හා මවුටන්ගේ කළමනාකරණ ග්‍රිතයට අනුව ඵලදායී කළමනාකරුවෙකු සතු නායක ශෛලීන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

iii. බ්ලේක් හා මවුටන්ගේ කළමනාකරණ ග්‍රිතයට අනුව පාසලේ නායකයා ලෙස විදුහල්පතිවරයෙකුට දැරීමට සිදුවන විවිධ භූමිකා විභාග කරන්න. (ලකුණු 08)

11. i. අධීක්ෂණය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 04)

ii. සායනික අධීක්ෂණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා සායනික අධීක්ෂණය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 08)

12. i. "පන්ති කළමනාකරණය" යන්නෙන් අදහස් වන්සේ කුමක් ද? (ලකුණු 04)

ii. විද්‍යා/ගණිත ගුරුවරයෙකු ලෙස "යහපත් පන්ති කළමනාකරණයක්" පැවතීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 08)

iii. විද්‍යා/ ගණිත ගුරුවරයෙකු විසින් පන්ති කාමර කළමනාකරණයේ දී මුහුණ දෙන්නා වූ ගැටලු දෙකක් **(02)** සඳහන් කර ඒවා මගහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

13. i. මාස්ලෝගේ අවශ්‍යතාධූරාවලිය රූප සටහනකින් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

ii. මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය විදුහල්පතිගේ කළමනාකරණ භූමිකාවට වැදගත් වන්නේ කෙසේදැයි උදාහරණ දෙකක් **(02)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. පාසලේ කළමනාකරණ ක්‍රියාවලිය සඳහා මාස්ලෝ විසින් ඉදිරිපත් කල අවශ්‍යතා ධූරාවලිය දායක කරගත හැකි ආකාරය උදාහරණ තුනක් **(03)** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

14. පහත මාතෘකා අතරින් ඕනෑම දෙකක් **(02)** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

i). පාසල් සම්පත් කළමනාකරණය
ii) හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzberg) විසින් ඉදිරිපත් කල කළමනාකරුවාගේ භූමිකා
iii) අභ්‍යන්තර කාර්යක්ෂමතාවය
iv). පන්තිකාමර විනය (ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.